# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 19 දරන
# ශ්‍රී ලංකා හෙද සභා පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූනි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ජූනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 1.20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූනි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 66/84

**හෙදවරයන් බඳවාගැනීම, හෙදවරයන්ගේ අධ්‍යාපනය සහ වෘත්තිය පරිචයන් සම්බන්ධයෙන් වූ සම්මතයන් සැකසීම පිළිබඳව රජයට උපදෙස් දීමට හෙද සභාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද හෙදවරයන් ලියාපදිංචි කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1988 අංක 19 දරන ශ්‍රී ලංකා හෙද සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු, "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දින යක එය ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

## I වන කොටස

### ශ්‍රී ලංකා හෙද සභාව පිහිටුවීම

2. (1) (මෙහි මින්මතු 'සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා හෙද සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ.

ශ්‍රී ලංකා හෙද සභාව පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් සභාවට දී ඇති නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද, ඒ නාමයෙන් සභාව විසින් සහ ඊට විරුද්ධව නඩු පැවරිය හැකි අතර යම් චංචල හෝ නිශ්චල දේපළක් දැරීම, අත්කර ගැනීම සහ බැහැර කිරීම ද සභාව විසින් කළ හැකි ය.

(3) සභාවේ ලේකම් විසින් හෝ සභාව විසින් බලය දෙන ලද වෙන යම් තැනැත්තකු විසින් හෝ ලියවිල්ලකින් දෙන ලද බල යක් නොමැති ව සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු ය.

3. සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :—

සභාව සංස්ථාපනය කිරීම.

(i) සභාවේ සභාපතිවරයා ;

(ii) (අ) හෙද පරිපාලනය පිළිබඳ පස් අවුරුදු පළපුරුද්දක් ඇතුළු දොළොස් අවුරුද්දකට නො අඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්දක් ඇත්තාවූ ; සහ

(ආ) හෙද පරිපාලනය පිළිබඳ නියමිත පශ්චාත් උපාධි සුදුසුකමක් ලැබුවාවූ ද

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ ශික්ෂණ රෝහල් අමාත්‍යාංශයේ වෛද්‍ය සේවයෙහි විශේෂ ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ හෙද නිලධරයන් විසින් තෝරාපත් කරගත්, ලියාපදිංචි කර ඇත්තා වූ ද වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද හෙදවරයෝ ;

ජ 093095—8,165 (86/10)

(iii) (අ) අවුරුදු දොළහකට නොඅඩු කාලයක් හෙද පාසැලක ඉගැන්වීමෙහි හෝ පරිපාලනයෙහි පළපුරුද්දක් ඇත්තා වූ; සහ

(ආ) නියමිත පශ්චාත් උපාධි සුදුසුකම් ලැබුවාවූ ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද අධ්‍යාපන අංශයේ විශේෂ ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ හෙද නිල ධරයන් විසින් තෝරාපත් කරගත්, ලියාපදිංචි කර ඇත්තා වූ ද වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද හෙද වරයෙක් ;

(iv) (අ) මහජන සෞඛ්‍ය හෙද ක්ෂේත්‍රයෙහි අවුරුදු දොළහ කට නොඅඩු කාලයක් පළපුරුද්දක් ඇත්තා වූ; සහ

(ආ) නියමිත පශ්චාත් උපාධි සුදුසුකමක් ලැබුවා වූ ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ හෙද නිලධරයන් විසින් තෝරා පත් කරගත් ලියාපදිංචිකර ඇත්තා වූ ද වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද හෙදවරයෙක් ;

(v) (අ) පළාත් පාලන සේවයේ සේවයෙහි නියුක්තව සිටින්නා වූ ද ;

(ආ) අවුරුදු දොළහකට නො අඩු කාලයක් හෙද වෘත්තියෙහි පළපුරුද්ද ඇත්තා වූ; සහ

(ඇ) නියමිත පශ්චාත් උපාධි සුදුසුකමක් ලැබුවා වූ ද, පළාත් පාලන සේවයේ හෙද නිලධරයන් විසින් තෝරා පත් කරගත්, ලියා පදිංචිකර ඇත්තා වූ ද වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද හෙදවරයෙක් ;

(vi) තත් කාලයෙහි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය ඉටු කරන තැනැත්තා ;

(vii) හෙද වෘත්තියෙහි යටත් පිරිසෙයින් අවුරුදු පහක පළ පුරුද්දක් ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික හෙදවරයන් අතුරෙන් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ලියා පදිංචිකර ඇත්තාවූ ද, වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද හෙදවරයන් තිදෙනෙක් ;

(viii) මුදල් විෂයය භාර අමාත්‍යවරයා ගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තෙක් ;

(ix) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් නාම් කරනු ලබන තැනැත්තෙක් ;

(x) ශික්ෂණ රෝහල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන හෙද නිලධර යෙක් ;

(xi) රජයේ නිලධරයන් නොවන හෝ රජයෙන් විශ්‍රාම වැටුපක් නොලබන, හෙද ශුභ සාධනයෙහි ලා උනන්දුවක් දක්වන තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක් ;

(xii) තත් කාලයෙහි සෞඛ්‍ය අමාත්‍යාංශයේ (වෛද්‍ය සේවා) වෛද්‍ය අධ්‍යක්ෂගේ කාර්ය ඉටුකරන තැනැත්තා ;

(xiii) තත් කාලයෙහි සෞඛ්‍ය අමාත්‍යාංශයේ (මහජන සෞඛ්‍ය සේවා) වෛද්‍ය අධ්‍යක්ෂගේ කාර්ය ඉටුකරන තැනැත්තා ;

(xiv) තත් කාලයෙහි සෞඛ්‍ය අමාත්‍යාංශයේ (අධ්‍යාපන) වෛද්‍ය අධ්‍යක්ෂගේ කාර්ය ඉටුකරන තැනැත්තා ;

(xv) තත් කාලයෙහි ශික්ෂණ රෝහල් විෂයය භාර අමාත්‍යවර යාගේ අමාත්‍යාංශයේ වෛද්‍ය අධ්‍යක්ෂගේ කාර්ය ඉටුකරන තැනැත්තා ;

(xvi) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධරයන් විසින් තෝරාගනු ලබන, ලියාපදිංචිකර ඇත්තා වූද වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද වෛද්‍යවරයෙක් ;

(xvii) පෞද්ගලික අංශයෙහි වෛද්‍ය නිලධරයන් විසින් තෝරාගනු ලබන, ලියාපදිංචි කර ඇත්තාවූ ද වෘත්තියෙහි යෙදී සිටින්නාවූ ද වෛද්‍ය වරයෙක්.

4. (1) නිල බලයෙන් සාමාජිකයකු නොවන සභාවේ සෑම සාමාජිකයකුම, ඔහු කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, අවුරුදු පහක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, නැවත තෝරා පත් කිරීම හෝ නැවත නම් කිරීම සඳහා ඔහු සුදුස්සකු විය යුතු ය. සාමාජික ධුර කාලය.

(2) තෝරා පත්කරගත් සාමාජිකයකු හෝ නම්කළ සාමාජිකයකු, ස්වකීය ධුර කාලය ඉකුත්වීමට පෙරාතුව ස්වකීය ධුරය අත්හැරිය හොත්, ධුරය අත්හරිනු ලැබූ සාමාජිකයා 3 වන වගන්තියේ විධි විධාන යටතේ තෝරා පත්කර ගත් හෝ නම්කළ ආකාරයටම වෙනත් සාමාජිකයකු තෝරා පත්කර ගැනීම හෝ නම්කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ධුරය අත්හරින සාමාජිකයකු වෙනුවට තෝරා පත්කරගනු ලබන හෝ නම්කරනු ලබන සාමාජිකයකු කලින් ඔහු ධුරය අත් හරිනු ලැබුව හොත් මිස, තමා අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) නිල බලයෙන් පත් වූ සභාවේ සෑම සාමාජිකයෙක් ම තමා සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරන ලද්දේ යම් නිලයක් ප්‍රකාර ද ඒ නිලය දරන තාක් කල් සභාවේ ධුරය දැරිය යුතු ය.

5. නිල බලයෙන් පත්වූ සාමාජිකයකු නොවන සභාවේ සාමාජික යකු— සාමාජිකයන් විසින් ධුර අත් හරිනු ලැබීම.

(අ) මිය ගියහොත් ;

(ආ) සභාවේ සභාපතිවරයා හෝ ලේඛකාධිකාරී අමතන ලද ලිපි යක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ;

(ඇ) සභාවේ මතය අනුව සෑහෙන්නා වූ හේතුවක් නොමැතිව පිළිවෙළින් සභාවේ රැස්වීම් තුනකට නොපැමිණියහොත් ;

(ඈ) ඔහුගේ හෝ ඇයගේ නම ලේඛනයෙන් ඉවත් කිරීමේ ප්‍රති ඵලයක් වශයෙන් ලියාපදිංචිකළ වෛද්‍යවරයෙක්වීම නතර වුවහොත් ;

(ඉ) වස්තු භංගත්වයට පත් වූ හෝ බංකොලොත් වූ තැනැත්තකු වශයෙන් නිසි අධිකරණයක් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත් ;

(ඊ) එක් වර්ෂයක කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටිය හොත්, හෝ

(උ) නම්කළ සාමාජිකයකු වන්නේ නම් 6 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්,

ඒ සාමාජිකයා ධුරය හිස් කරන්නේ ය.

**සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම.**

6. (1) සභාවේ යම් නම් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යාවෝචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ඒ සඳහා කිසිම හේතුවක් නොදක්වා අමාත්‍යවරයා විසින් ඔහු ඉවත් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, වෙනත් අමාත්‍යවරයකුගේ නිර්දේශය මත නම්කරන ලද සාමාජිකයකු, ඒ වෙනත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පමණක් ඉවත්කරනු ලැබිය යුතු ය.

(2) තමා ධුරයේ නොකඩවා රැඳී සිටීම සභාවේ යහපතට හානි කරවන අයුරින් සභාවේ සාමාජිකයකු වශයෙන් යම් නම්කළ සාමාජික යකු සිය ධුරය අතිසිලෙස යොදවනු ලැබුවහොත් ඒ සාමාජිකයා ධුර යෙන් ඉවත් කරනු ලැබිය යුතු යයි සභාව විසින් අමාත්‍යවරයාට නිර්දේශ කළ හැකි ය. එවැනි නිර්දේශයක් මත මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයා විසින් එවැනි සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(3) පෙරාතුවම වූ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත සභාව විසින් නිර්දේශ කරන අවස්ථාවක, ඒ නිර්දේශය කරනු ලබන්නේ යම් සාමාජිකයකුට විරුද්ධව ද ඒ සාමාජිකයා ඉවත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශයක් කරන ලද බව දැනුම්දෙන ලිඛිත දැන්වීමක් ඒ අවස්ථාවේ දී ම ඔහු වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ නිර්දේශයක් කරන ලද්දේ සභාවේ යම් සාමාජිකයකුට විරුද්ධව ද ඒ සාමාජිකයා විසින්, (3) වන උපවගන්තිය යටතේ ඔහු වෙත දැන්වීම භාරදුන් දින සිට දින දාහතරක් ඇතුළත නිර්දේශයට විරුද්ධව අමාත්‍යවරයා වෙත කරුණු සැලකර සිටිය හැකි ය. (2) වන උපවගන්තිය යටතේ වූ සිය බලතල ක්‍රියාත්මක කළ යුත්තේ ද නැද්ද යන බව තීරණය කිරීමට පෙර අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයාට ඇහුම්කන්දීමේ අවස්ථා සලස්වා දිය යුතු ය.

**ඡන්ද දීම සහ සභාපතිවරයා තෝරාපත් කර ගැනීම.**

7. (1) සභාවේ සියළුම සාමාජිකයින්ට ඡන්දය දීමේ අයිතිය තිබිය යුතු ය.

(2) සභාව විසින්, සභාවේ තෝරාපත් කරගත් සාමාජිකයන් අතුරෙන් සභාපතිවරයකු සහ උපසභාපතිවරයකු තෝරාපත් කර ගතයුතු අතර, තමා පැමිණ සිටින සභාවේ සෑම රැස්වීමකදී ම සභා පතිවරයා මුලසුන දැරිය යුතු ය.

(3) සභාපතිවරයා නොපැමිණි විටෙක, උප සභාපතිවරයා සභාවේ රැස්වීමක මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම නොපැමිණි විටෙක ඒ රැස්වීමට සහභාගිවන සභාවේ සාමාජිකයන් විසින්, පැමිණ සිටින තෝරාපත් කරගත් සාමාජිකයන් අතුරෙන් ඒ රැස්වීමේ මුලසුන දැරීමේ කාර්යය සඳහා සභාපතිවරයකු තෝරා පත්කර ගත යුතු ය.

8. රැස්වීමක ගණපූරණය දහතුනක් විය යුතු ය. ගණපූරණය.

9. සභාව විසින් සලකා බැලීම සඳහා පැන නගින සෑම ප්‍රශ්නයක්ම, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කළ යුතු අතර, ඒ රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය. සභාවේ කටයුතු.

10. සභාවේ සෑම රැස්වීමකම කටයුතු පිළිබඳ වාර්තා, තත් කාර්යය සඳහා තැබිය යුතු පොතක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ඒ රැස්වීමේ මුලසුන දරන තැනැත්තා විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය. රැස්වීම් කටයුතු පිළිබඳ වාර්තා.

## II වන කොටස

## සභාවේ බලතල සහ කර්තව්‍ය

11. (1) සභාවේ කටයුතු කළමණාකරණය සහ පරිපාලනයෙහි ලා අවශ්‍ය වන්නා වූ හෝ හිතකර වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ හෝ සියලු දේ කිරීමට සභාවට බලය තිබිය යුතු ය. සභාවේ බලතල සහ කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල හා කර්තව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම, කරනු ලැබිය හැකි ය:—

(අ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පොදු හෙද සහතිකයක් හෝ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් බැහැර පිළිගත් අධ්‍යාපන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබ, ඒ ආයතනයේ විෂයමාලාව සහ පුහුණුවීමේ මට්ටම කෙරෙහි සැලකිලිමත්ව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද්දා වූ ද සහතිකයක් හෝ ලබාගත් තැනැත්තෙක් හෙදවරයකු ලෙස ලියාපදිංචි කිරීම ;

(ආ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයෙහි තම නම් ලියාපදිංචි කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි යම් ගාස්තු සුදුසුකම් ලත් හෙදියන්ගෙන් අයකිරීම ;

(ඇ) ලියාපදිංචි හෙදවරයකුගේ නම ලේඛනයෙන් අත්හිටුවීම හෝ ඉවත් කිරීම හෝ ලේඛනයෙහි නැවත ඇතුළත් කිරීම හෝ විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් සාදන ලද නියෝගවලට අනුකූලව අවශ්‍ය වන වෙන යම් විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීම ;

(ඈ) හෙදවරයන් සඳහා වූ සියලුම අධ්‍යයන පාඨමාලා සඳහා අපේක්ෂකයින් තෝරාගැනීම සහ බඳවා ගැනීම සම්බන්ධයෙන් වූ කොන්දේසි ආණ්ඩුවට නිර්දේශ කිරීම ;

(ඉ) හෙදවරයන් සඳහා වූ සියලුම අධ්‍යයන පාඨමාලා සම්බන්ධයෙන් වූ විෂය මාලාව ආණ්ඩුවට නිර්දේශ කිරීම ;

(ඊ) හෙදවරයන් සඳහා වූ අධ්‍යයන පාඨමාලාවල දී භාවිත කරනු ලබන පාඨ ග්‍රන්ථ ආණ්ඩුවට නිර්දේශ කිරීම සහ අවශ්‍ය වුවහොත්, ඒ පාඨ ග්‍රන්ථ පිළියෙල කර ප්‍රකාශයට පත් කිරීම ;

(උ) හෙදවරයන් සඳහා සභාව විසින් තීරණය කරන ආකාරයේ යම් ශුභ සාධක පහසුකම් සැපයීම සහතික කිරීම ;

(ඌ) නිසි හෙද ප්‍රමිති පවත්වාගෙන යාම සහතික කිරීමෙහිලා අවශ්‍ය යම් පියවර ආණ්ඩුවට නිර්දේශ කිරීම ;

(එ) හෙදකම පිළිබඳ අධ්‍යයන පාඨමාලා සපයනු ලබන අධ්‍යාපනික ආයතන පරීක්ෂා කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ වැඩ පිළිවෙලවල් සකස් කිරීම ;

(ඒ) හෙදවරයන්ගේ වෘත්තීය පැවැත්ම විධිමත් කෙරෙන ආචාර ධර්ම පද්ධතියක් නියම කිරීම ;

(ඔ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාවේ නිලධරයන් සහ සේවකයින් පත් කිරීම, සේවයෙහි නියුක්ත කරවීම සහ ඔවුනට පාරිශ්‍රමික ගෙවීම සහ සභාවේ සේවා නියුක්තයින් පත් කිරීම, උසස් කිරීම ඔවුන්ගේ පාරිශ්‍රමික, විනය පාලනය සහ ඔවුනට නිවාඩු සහ වෙනත් ප්‍රතිලාභ ලබාදීම පිළිබඳ රීති සෑදීම.

සභාවේ බලතල කර්තව්‍ය සහ කාර්ය පැවරීම.

**12.** සභාව විසින්, ස්වකීය බලතල කර්තව්‍ය හෝ කාර්ය කිසිවක්, සභාවේ සාමාජිකයින්ගෙන් පස් දෙනකුට නොඅඩු කාරක සභාවකට කලින් කල පැවරිය හැකි අතර, සභාව විසින් පනවනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, ඒ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ඒ කාරක සභාව විසින් කළ යුතු ය.

සභාවේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් පාරිශ්‍රමික.

**13.** මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් සභාවේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් සභාවේ සාමාජිකයින්ට ගෙවනු ලැබිය හැකි ය.

ලේඛකාධිකාරී සහ වෙනත් නිලධරයෝ.

**14.** සභාවේ ලේකම් සහ භාණ්ඩාගාරික වශයෙන් ද ක්‍රියා කළ යුතු ලේඛකාධිකාරිවරයකු සභාව විසින් පත් කළ යුතු ය.

අමාත්‍යවරයා වෙත අභියාචනා කිරීම.

**15.** (1) සභාවේ නියමයකින් හෝ තීරණයකින් හෝ 12 වන වගන්තිය යටතේ සභාවේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරන ලද කාරක සභාවක නියමයකින් හෝ තීරණයකින් අතෘප්තියට පත් තැනැත්තකු විසින්, ඒ නියමයට හෝ තීරණයට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(2) එවැනි යම් අභියාචනයක් තීරණය කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයාට අවශ්‍ය විය හැකි සියලු තොරතුරු සභාව වෙත ලේඛකාධිකාරී විසින් සපයනු ලැබිය යුතු ය.

**ලේඛකාධිකාරී විසින් ලේඛනයක් තැබිය යුතු බව.**

16. (1) මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව, ශ්‍රී ලංකාවේ හෙදවරයන් වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා සුදුසුකම් ලැබුවා වූ ද මේ පනත යටතේ ලියාපදිංචි කළ යුතු යයි සභාව තීරණය කරන ලද්දා වූ ද තැනැත්තන්ගේ ලේඛනයක්, ලේඛකාධිකාරී විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) වයස අවුරුදු විසි එකකට අඩු කිසිම තැනැත්තෙක් හෙදවරයකු වශයෙන් ලියාපදිංචි නොකළ යුතු ය.

(3) අමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනරජයේ ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව හැර කිසිම විදේශිකයකු ලියාපදිංචි නොකළ යුතු ය.

(4) ලියාපදිංචි කිරීම සඳහා වූ තම හිමිකම් පෑම ඔප්පු කරන ලද සෑම තැනැත්තකුගේ ම නම ලේඛකාධිකාරී විසින් ලියාපදිංචි කළ යුතු අතර, එවැනි සෑම තැනැත්තකුගේම නම සභාවේ ඊළඟ රැස්වීමේදී සභාවට වාර්තා කළ යුතු ය.

(5) නියමිත ගාස්තුව ගෙවුවහොත් මිස, කිසිම තැනැත්තකු මේ පනත යටතේ ලියාපදිංචි නොකළ යුතු ය.

**වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද හෙදවරයන්, මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සේ සැලකිය යුතුබව.**

17. නියමිත දිනට පෙරාතුවම වූ දිනයෙහි වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද හෙදවරයන් එදින පටන් මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද ලෙස සැලකිය යුතු අතර, එවැනි සියලුම තැනැත්තන්ගේ නම් මේ පනත යටතේ පවත්වාගෙන යන ලේඛනයට ලේඛකාධිකාරී විසින් මාරු කරනු ලැබිය යුතු ය.

**සුදුසුකම් වෙනස් කිරීම.**

18. තමා ලියාපදිංචි වූයේ යම් උපාධියක් හෝ සුදුසුකමක් මත ද ඒ උපාධිය හෝ සුදුසුකම නොවන වෙනත් යම් උපාධියක් හෝ සුදුසුකමක් ලබා ගන්නා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ලේඛනයේ එවකටත් ඇතුළත් කර ඇති උපාධියට හෝ සුදුසුකමට අමතරව, එවැනි වෙනත් යම් උපාධියක් හෝ සුදුසුකමක් ලියාපදිංචි කරගැනීම සඳහා ඉල්ලුම් කළ හැකි ය.

**ලේඛකාධිකාරී ලේඛනය නිවැරදිව පවත්වාගෙන යා යුතු බව.**

19. (1) ලේඛකාධිකාරී විසින් ලේඛනය ඒ ඒ දිනට නිවැරදිව තැබිය යුතු අතර, මියගිය යම් තැනැත්තකුගේ නම ලේඛනයෙහි අවලංගු කළ යුතු ය.

(2) ලේඛනයක යම් සටහනක් වංචනිකව හෝ වැරදි ලෙස කර ඇති බවට සභාව සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, ඒ සටහන, සභාවේ නියමවලට අනුව සහ අනුකූලව ලේඛනයෙන් මකා දැමීම හෝ නිවැරදි කිරීම ලේඛකාධිකාරී විසින් කළ යුතු අතර, එවැනි යම් මකාදැමීමක් හෝ නිවැරදි කිරීමක් කරනු ලැබීමට හේතුව ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

ලේඛනයෙන් නම් මකා දැමීම.

20. (1) යම් තැනැත්තකු—

(අ) හෙදියක වශයෙන් තමා ලියාපදිංචි කරනු ලැබුවේ යම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් මත ද ඒ ඩිප්ලෝමාව, උපාධිය හෝ සහතිකය ඒ තැනැත්තාට අහිමි වුවහොත් ;

(ආ) බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය හැකි වූ ද එම තැනැත්තා හෙදවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නුසුදුස්සකු බව පෙනී යන්නා වූ ද වරදකට වරදකරු කරනු ලැබුවහොත් ;

(ඇ) හෙදවරයකු වශයෙන් වෘත්තියට නුසුදුසු චරිතයකින් යුක්ත වුවහොත් හෝ නුසුදුසු පැවැත්මකට වරදකරු වුවහොත් ;

(ඈ) හෙදවරයකු වශයෙන් වූ නොසැලකිල්ල හෝ අශක්‍නුතාව හේතුකොටගෙන හෙදියක වශයෙන් නොකඩව වෘත්තියෙහි යෙදීමට බියකින් තොරව ඉඩදිය නොහැකි වුවහොත්

ඒ තැනැත්තාගේ නම ලේඛනයෙන් මකා දැමීම සඳහා ලේඛකාධිකාරීට නියම කිරීමට සභාවට බලය ඇත්තේ ය.

(2) 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුගේ නම ලේඛනයෙන් මකා දැමීම සඳහා සභාව නියමයක් කිරීමට පෙර, නිශ්චිත කාලයක් තුළ හේතු දැක්විය යුතු යයි නියම කෙරෙන ලිඛිත දැන්වීමක් ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබිය යුතු ය. එවැනි නියමයක් නො කළ යුත්තේ මන්දැයි හේතු දැක්විය යුතු නිශ්චිත කාලය කිසිම අවස්ථාවක දී, දැන්වීම ඔහු වෙත භාරදුන් දින සිට දින දාහතරකට නොඅඩු විය යුතු අතර, සභාව විසින්, ඒ නියමය කරනු ලැබීමට පෙර, ඒ තැනැත්තාගේ විරෝධතා ඇතොත්, ඒවා සලකා බලා, සභාවේ නියමය අදාළ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ලේඛනයෙහි ඇතුළත් දේවල් ඔප්පු කිරීම.

21. (1) සියලුම සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී—

(අ) සත්‍යයයි ලේඛකාධිකාරි විසින් සහතික කරන ලද, ලේඛනයක යම් උධෘතයක් හෝ පිටපතක් ඔප්පු කිරීමකින් තොරව සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර, ඒවා ලේඛනයේ ඇතුළත් දේවල්වල මුල් බැල්මට පෙනෙන ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය ;

(ආ) යම් තැනැත්තකුගේ නම ලේඛනයක ලියාපදිංචි කළ හෝ නොකළ බවට නැතහොත්, සහතිකයේ සහතික කළ දින හෝ කාලය තුළ එසේ ලියාපදිංචි කළ හෝ නොකළ බවට ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, එය එහි දක්වන ලද කරුණු පිළිබඳ වූ මුල් බැල්මට පෙනෙන ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

(2) අධිකරණය විසින් අන්‍යාකාරයෙන් නියම කරතහොත් මිස, මේ වගන්තියේ කාර්යය සඳහා, එවැනි යම් පිටපතක් සම්බන්ධයෙන් ලේඛකාධිකාරිවරයාගේ අත්සන හෝ ලේඛකාධිකාරී වශයෙන් ඔහුගේ පත්වීම හෝ පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නොවන්නේ ය.

## III වන කොටස

### මුදල් සහ ගිණුම්

22. (1) සභාව විසින් "ශ්‍රී ලංකා හෙදි අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවා පවත්වා ගෙන යා යුතු ය. සභාවේ අරමුදල.

(2) අරමුදලට—

(අ) මේ පනත යටතේ ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් ලැබෙන යම් මුදලක් ;

(ආ) යම් පරිත්‍යාගයක් සහ සභාවට දෙනු ලැබූ යම් ත්‍යාග විකිණීමෙන් ලත් මුදල් ; සහ

(ඇ) ආයෝජන හෝ වෙනත් ලැබීම්වලින් ලද යම් ආදායමක් ගෙවිය යුතු ය.

(3) සභාව විසින් ස්වකීය බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී දරන ලද යම් වියදමක් සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

(4) අරමුදල පරිපාලනය කිරීම සඳහා සභාව වගකිව යුතු ය.

23. (1) සභාවේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම්, සහ සභාවේ සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සභාව විසින් සැලැස්විය යුතු ය. සභාවේ ගිණුම්.

(2) සභාව විසින්, ස්වකීය ගිණුම්, අනුමත විගණකවරයකු ලවා විගණනය කරවීමට සැලැස්විය යුතු ය.

(3) සභාවේ මුදල් වර්ෂය ජනවාරි මස පළමුවනදායින් ආරම්භවන වර්ෂය විය යුතු ය.

24. එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව සහ ඉක්බිතිව එළඹෙන එක් එක් වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර, සභාව විසින්, එහි කටයුතු සහ ඒ මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ ආදායම සහ වියදම පිළිබඳ සත්‍ය වූ ද නිවැරදි වූ ද විස්තරයක් ඉදිරිපත් කෙරෙන වාර්තාවක් පිළියෙළ කළ යුතු ය. වාර්ෂික වාර්තාව.

25. (1) (අ) මේ පනත යටතේ යථා පරිදි ලියාපදිංචි නොකළ තැනැත්තකුව සිට "ලියාපදිංචි කළ හෙදවරයා" යන පදවි නාමය හෝ වෙනත් භාෂාවකින් වූ එහි අනුරූපය ඒ ආකාරයෙන් ම හෝ වෙනත් වචනයක් හෝ අකුරක් සමඟ සංයුක්ත කිරී දණ්ඩන.

මෙන් හෝ හාජන කරන්නා වූ හෝ, මේ පනත යටතේ ලියාපදිංචි හෝ ලියා පදිංචි හෙදවරයෙක් වශයෙන් නීතියෙන් පිළිගත් බව හඟවන යම් නාමයක් පදවි නාමයක්, එක් කිරීමක්, විස්තර යක්, නිල ඇඳුමක් හෝ ලාංඡනයක් භාවිත කරන්නා වූ හෝ, මේ පනත යටතේ ලියා පදිංචි කළ හෙදවරයන්ගේ භාවිතය සඳහා නියමිත යම් පදවි නාමයක්, නිල ඇඳුමක් හෝ ලාංඡන යක් භාවිත කරන්නා වූ; හෝ

(ආ) තමා වෙත හෝ වෙන යම් තැනැත්තකු වෙත හෙද වරයකු වශයෙන් මේ පනත යටතේ නිකුත් කරන ලද යම් ලියාපදිංචි කිරීමේ සහතිකයක් වංචා කිරීමේ චේතනාව ඇතිව ප්‍රයෝජනයට ගන්නා වූ

යම් තැනැත්තකු, වරදකට වරදකරුවන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, පළමුවන වරද සම්බන්ධයෙන් රුපියල් දහසකට සහ දෙවන වරද හෝ යම් තදනන්තර වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන් දහසකට වැඩි නොවන දඩයකට යටත් විය යුතු ය.

(2) ලේඛනයට අදාළ යම් කරුණක් වරදවා පෙන්නුම් කිරීමක් හිතාමතාම කරනු ලබන හෝ කිරීමට සලස්වනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ සමසකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) යම් වෛද්‍ය ආයතනයක වැඩ කිරීම සඳහා හෙදවරයකු වශයෙන් වෙනත් තැනැත්තකු සේවයෙහි යොදවන යම් තැනැත්තකු, ඒ වෙනත් තැනැත්තා පනත යටතේ ලියාපදිංචි කර නොලැබ ඇත්නම්, වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ සමසකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(4) ලාභය තකා හෙද වෘත්තියෙහි යෙදෙන ලියාපදිංචි කළ හෙද වරයකු නොවන්නා වූ යම් තැනැත්තකු වරදකට වරදකරුවන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

(5) (3) වන හෝ (4) වන උපවගන්තිවල සඳහන් කිසිවක්, නියමිත දින සිට අවුරුදු පහක කාලයකට—

(අ) හෙද නිවාස (විධිමත් කිරීම) පනත යටතේ ලියාපදිංචි කරන ලද හෙද නිවාසයක හෙදවරයෙක් වශයෙන් වැඩ කිරීම සඳහා ලියාපදිංචි නොකළ හෙදවරයෙක් නොවන තැනැත්තකු සේවයෙහි නියුක්ත කරවන යම් තැනැත්තකු ; හෝ

(ආ) ලියාපදිංචි කළ හෙදවරයෙක් නොවන්නාවූ ද හෙද නිවාස (විධිමත් කිරීම) පනත යටතේ ලියාපදිංචි කළ හෙද නිවාසයක ලාභය තකා හෙද වෘත්තියෙහි යෙදෙන්නාවූ ද යම් තැනැත්තකු

සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**26.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත වන්නා වූ හෝ නියෝග සෑදිය යුතු යයි බලය දී ඇත්තා වූ කරුණු සම්බන්ධයෙන් සහ විශේෂයෙන් පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඒ අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය :— නියෝග.

(අ) ශ්‍රී ලංකාවේ හෙදවරයන් වශයෙන් වෘත්තියෙහි යෙදීමට සුදුසුකම් ලත් තැනැත්තන්ගේ ලේඛනය තැබීමේ ආකෘතිය සහ ආකාරය ;

(ආ) හෙදවරයන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමේ ආකෘතිය ;

(ඇ) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තන් විසින් ඇඳිය හැකි නිල ඇඳුම්, ලාංඡනය සහ වෙනත් හැඳින්වීමේ සලකුණු ;

(ඈ) ලියාපදිංචිය සහ ලේඛනයේ වෙනස් කිරීම් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු ;

(ඉ) විනයානුකූල කාර්ය පරිපාටිය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, ඒ පළකිරීමේ දින හෝ එහි සඳහන් කෙරෙන යම් පසු දිනයක හෝ ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසුව, හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක්ම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) සෑම නියෝගයක්ම පරිච්ඡින්න කළ යුතු ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඉවත් කිරීම.

**27.** (1) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ IX වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී කොටස ඉවත් කිරීම සිදුකර ඇත්තේ වුව ද, ඒ කොටස යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද්දා වූ සහ නියමිත දිනයේ බලපවත්නා වූ සියලු නියෝග මේ පනත යටතේ සාදන ලද නියෝග වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් ඒවා සංශෝධනය කරනු ලැබිය හැකිය ; ඒවාට යමක් එකතු කරනු ලැබිය හැකි ය. නැතහොත් පරිච්ඡින්න කරනු ලැබිය හැකි ය.

සභාව, අල්ලස් පනත යටතේ උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**28.** අල්ලස් පනතේ අර්ථානුකූලව, සභාව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

අර්ථ නිරූපනය.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

" අනුමත විගණකවරයා " යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙන යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් තේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ අදහස් වේ;

" ලංකා වෛද්‍ය සභාව " යන්නෙන්,

(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත යටතේ සංස්ථාපිත ලංකා වෛද්‍ය සභාව අදහස් වේ;

" නිල බලයෙන් පත්වූ සාමාජිකයා " යන්නෙන්,

3 වන වගන්තියේ (xii) වන, (xiii) වන, (xiv) වන, (xv) වන සහ (xvi) වන ඡේදවල විධිවිධාන යටතේ පත් කරන ලද සභාවේ සාමාජිකයකු වන යම් තැනැත්තකු අදහස් වේ;

" නියමිත " යන්නෙන්,

මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.